2022 වර්ෂය සඳහා කාර්ය සාධන වාර්තාව

ජාතික පොලිස් කොමිෂන් සභාව

වැය ශීර්ෂ අංකය 08

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ 02-08

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 09-32

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය 33-42

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක 43-44

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 45-46

පරිච්ඡේදය 06 - මානව සම්පත්පැතිකඩ 47-47

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 48-54

01 පරිච්ඡේදය
ආයතනික පැතිකඩ

1.1. හැඳින්වීම

2002 වර්ෂයේදී 17 වන ව්‍යවස්ථා සංශෝධනය හරහා ප්‍රථම වරට ජාතික පොලිස් කොමිෂන් සභාවක් පිහිටුවීමේ මූලික අරමුණ වූයේ පොලිස් සේවාව නිර්දේශපාලනය කිරීම සහ ස්වාධීන කිරීම මගින් කාර්යක්ෂමවූත්, ජනහිතකාමීවූත්, ඵලදායීවූත් සේවාවක් මහජනතාවට ලබාදීමය. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා පොලිස් සේවයේ බඳවාගැනීම්, ස්ථාන මාරු කිරීම්, උසස් කිරීම්, පොලිස් නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම් සහ පොලිසියට එරෙහිව මහජනතාව විසින් කරනු ලබන පැමිණිලි විමර්ශන කිරීම් යනාදි බලතල ජාතික පොලිස් කොමිෂන් සභාවට පවරන ලදී.

2020 වසරේදී විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක වීමත් සමඟ පොලිස් සේවාවේ පත් කිරීම්, මාරු කිරීම්, උසස් කිරීම් සහ විනයානුකූල ක්‍රියා කිරීමේ කටයුතුවල බලතල ජාතික පොලිස් කොමිෂන් සභාවෙන් ඉවත් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පවරනු ලැබූ අතර එම සංශෝධනය මඟින් ජාතික පොලිස් කොමිෂන් සභාවට පැවරුණු කාර්යය වූයේ පොලිස් නිලධරයකුට හෝ පොලිසියට එරෙහිව ජනතා සාමාජිකයකුගෙන් හෝ අතෘප්තියට පත් යම් තැනැත්තෙකුගෙන් හෝ ලැබෙන පැමිණිලි භාර ගැනීම සහ ඒ පිළිබඳ විමර්ශනය කිරීමය.

නමුත් 2022 වර්ෂයේදී සිදුකරන ලද 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරා තිබූ පොලිස් නිලධාරීන්ගේ පත් කිරීම්, මාරු කිරීම්, උසස් කිරීම්, විනයානුකූලව ක්‍රියා කිරීම් හා සේවයෙන් පහ කිරීමට අදාල බලතල නැවතත් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පවරන ලදී. ඒ අනුව එතෙක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කටයුතු කරන ලද එකී විෂය පථයට අදාල ලිපිගොනු 11,000 කට ආසන්න 2022 දෙසැම්බර් මාසයේ සිට වරින් වර සංඛ්‍යාවක් නැවතත් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත භාරදී ඇත. එයට අමතර 20 වන සංශෝධනය මඟින් ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පවරා තිබූ මහජන පැමිණිලි විමර්ශනය කිරීමේ කටයුතු ද ජාතික පොලිස් කොමිෂන් සභාවේ විෂය පථයට අයත්වන බැවින් එකී කටයුතු ද පවත්වාගෙන යාම තවදුරටත් සිදුකර ඇත. ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත නව කොමිෂන් සභාවක් පත් කරන තුරු පවතින කොමිෂන් සභාවට නව බලතල ක්‍රියාත්මක කළහැකි බවට නීතිපතිවරයා මාර්ගෝපදේශ ලබාදී ඇත.

කෙසේවෙතත්, කොමිෂන් සභාවේ බලතල සංයුතියේ ඇතිවූ වෙනසක් සමඟ ජාතික පොලිස් කොමිෂන් සභාවේ විෂය ක්ෂේත්‍රය පුළුල් වී ඇති අතර එම පුළුල් බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන මානව, භෞතික මෙන්ම මුල්‍ය සම්පත් හිඟය අභියෝගාත්මක එකක් වේ. පවත්නා ගැටළුකාරී තත්ත්වයන් අභිමුව පවා ජාතික පොලිස් කොමිෂන් සභාව අභියෝග ජය ගැනීම සඳහා කටයුතු කරමින් සිටී.

මෙම වාර්තාව මඟින් ආවරණය වන 2022.01.01 සිට 2022.12.31 දින දක්වා කාලය තුළ කොමිෂන් සභාවට පැවරී තිබූ මහජන පැමිණිලි භාර ගැනීම සහ විමර්ශනය කිරීමට අදාලව ලබාඇති ජයග්‍රහණ සහ මුහුණදුන් අභියෝග මෙම වාර්තාවට ඇතුලත් වේ.

2020 වර්ෂයේ දෙසැම්බර් මස 10 වන දින පත්වූ වර්තමාන කොමිෂන් සභාව විසින් එතෙක් පැවති විමර්ශන ක්‍රමවේදයේ ස්වභාවය, කාර්යක්ෂමභාවය කොතෙක් දුරට මහජනයාට සහන සලසා තිබුණේද යන්න පිළිබඳව දැඩිව අධ්‍යයනය කරන ලදී. ඒ අනුව නව කොමිෂන් සභාව විසින් මහජන පැමිණිලි විමර්ශනය සඳහා අනුගමනය කළ කාර්ය පටිපාටියේ පැවති දුර්වලතාවයන් පෙන්වාදී විධිමත් විමර්ශන ක්‍රමවේදයන්ට අනුව මහජන පැමිණිලි විමර්ශනය කිරීමට නව ප්‍රවේශයක අවශ්‍යතාවය හඳුන්වාදෙන ලදී.

ඒ අනුව 2021 මාර්තු මාසයේ මෙම නව ප්‍රවේශය හරහා පැමිණිලි විමර්ශනය කිරීමේ නව ක්‍රමවේදය ක්‍රියාත්මක කරන ලදී.

මෙම නව ක්‍රමයේ විශේෂතම ලක්ෂණ වන්නේ මහජන පැමිණිල්ල ලද පසු පැමිණිල්ල අධ්‍යයනය කොට පැමිණිලිකරුවන් සඳහන් කර ඇති කරුණු සහ ඉල්ලා ඇති සහන සම්බන්ධයෙන් පරීක්ෂාවට භාජනය කිරීමයි. වැඩිදුර තොරතුරු අවශ්‍ය වන්නේ නම් නැවතත් පැමිණිලිකරුවන්ගෙන් විමසීම් කොට වැඩිදුර තොරතුරු ලබාගෙන පසුව පැමිණිල්ලට අනුකූල වන පරිදි අදාල පොලිස් ස්ථානයෙන් ලේඛනගත සාක්ෂි සටහන් ද ලබාගෙන පැමිණිල්ලේ දක්වා ඇති පරිදි එම සිදුවීම සිදුවූයේද, නැතහොත් සිදු නොවූයේද යන සමබරතාවය මත සිට සාධාරණ තීරණයන්ට එළැඹ, මහජන පැමිණිලි සම්බන්ධයෙන් මහජනතාවට සහන සැලසීම වේ.

විමර්ශනය යනු දන්නා දෙයින් නොදන්නා දෙය කෙරෙහි යොමු වීමය. එසේම විමර්ශන කටයුතු අපක්ෂපාතීව ක්‍රියාවේ යොදවනු ලබනවා පමණක් නොව, අපක්ෂපාතීව ක්‍රියාවේ යොදවන බවට මහජනතාවට විශ්වාසයක් ඇතිවිය යුතු වේ. ඒ අනුව නව කොමිෂන් සභාව විසින් හඳුන්වාදුන් ක්‍රමවේදය මඟින් විමර්ශන සිදුකරන ක්‍රමවේදයේ යම් වෙනස්කම් සිදුකලා සේම විමර්ශන සිදුකර අවසන් කලයුතු ක්‍රමවේදයේද සංශෝධන සිදුකරන ලදී. ඒ අනුව මහජන පැමිණිල්ලක විමර්ශනයක් අවසන් කලහැකි වන්නේ කොමිෂන් සභාවට ඉදිරිපත් කර එහි අනුමැතිය ලැබීමෙන් පසු පමණක් බවට උපදෙස් ලබා දෙන ලදී.

මෙහිදී සෑම පැමිණිල්ලක්ම අවම වශයෙන් දෙවරක්වත් කොමිෂන් සභාවට ඉදිරිපත් කර එහි සාකච්ඡාවට ලක්වෙයි. එනම් පැමිණිල්ලක් ලද විගස කොමිෂන් සභාවට ඉදිරිපත් කර උපදෙස් ලබා ගැනීම සහ විමර්ශන අවසන් කිරීමේදී නිර්දේශ ඉදිරිපත් කර අවසන් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් සමහර සංකීර්ණ සහ ගැටළු සහගත පැමිණිලි පිළිබඳව කොමිෂන් පත්‍රිකා මඟින් ඒවායේ විමර්ශන ප්‍රගතිය පිලිබඳව කොමිෂන් සභාවට කරුණු ඉදිරිපත් කර උපදෙස් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

කෙසේ වෙතත් පැවති විවිධ අභ්‍යන්තර ගැටළුසහගත තත්ත්වයන් හමුවේ වුවද නව විමර්ශන ක්‍රමයට මෙම නිලධාරීන් හැඩගැස්වීම සඳහා විමර්ශන නිලධාරීන් පුහුණු කිරීම නොනවත්වාම කරගෙන යනු ලැබිණ. එම පුහුණුව වරින් වර කොමිෂන් සභා සාමාජිකයන් මඟින්ද සති පතා නීති නිලධාරී මඟින්ද ලබා ගැනීමටද කටයුතු කරනු ලැබේ.

2022 පෙබරවාරි සිට ජුනි දක්වා මුළු දිවයිනම මුහුණදුන් ආර්ථික හා සමාජ ගැටළු හේතුවෙන් ජාතික පොලිස් කොමිෂන් සභාවේ විමර්ශන කටයුතුවලටද බාධාවක් ඇති විය. රටතුල තැපැල් සේවය සහ ප්‍රවාහනය අඩාලවීම ආදිය ආයතනයේ කාර්යන් නිසි පරිදි පවත්වාගෙන යාමට යම් පමණකට බාධාවක් වුනි. කෙසේ වෙතත් හැකි සෑම විටම නිලධාරීන් කාර්යාලයට පැමිණීමටද, නිවසේ සිට රාජකාරී ඉටුකිරීමටද කොමිෂන් සභාව විසින් උපදෙස් ලබා දෙන ලදී. නව විමර්ශන අධ්‍යක්ෂවරුන් පත්කිරීමෙන් පසු ජාතික පොලිස් කොමිෂන් සභාව නව මුහුණුවරකින් නැවතත් විමර්ශන කටයුතු ආරම්භ කරනු ලැබිණ.

මෙම විමර්ශන ක්‍රමයේ පවතින වැදගත් කරුණු කිහිපයක් පහත දැක්වේ.

1. මහජන පැමිණිල්ල පොලිස් ස්ථානයට නොයැවීම.
2. පැමිණිල්ල අපැහැදිලි නම් සහ වැඩිදුර තොරතුරු අවශ්‍ය නම් නැවතත් පැමිණිලිකරුගෙන් ලිපියකින් විමසීම් කොට පිළිතුරු ලිඛිතව ලබාගැනීම.
3. මෙම තොරතුරු පදනම්කොට ගෙන අවශ්‍ය වන ලේඛනගත සාක්ෂි පොලිස් ස්ථානයෙන් ගෙන්වාගෙන තීරණ ගැනීම සහ විධිමත් විමර්ශන සැලැස්ම අනුව සියලු මහජන පැමිණිලි විමර්ශනය ක්‍රියාත්මක කිරීම.

ඉහත පෙන්නුම් කර ඇති පරිදි විමර්ශන කටයුතු කරගෙන ආ ක්‍රමය වෙනස් කරමින් ඵලදායී නව මුහුණුවරකට අවතීර්ණ වී නොයෙකුත් අභියෝග ජයගනිමින් ජාතික පොලිස් කොමිෂන් සභාව ක්‍රියාත්මක වෙමින් මහජන පැමිණිලි සම්බන්ධයෙන් සිදුවන ප්‍රමාදයද වළක්වා ගන්නට ජාතික පොලිස් කොමිෂන් සභාව සමත්වී ඇත.

මෙම නව ක්‍රමය හඳුන්වාදීමෙන් පසුව පොලිසියට සහ පොලිස් නිලධාරින්ට විරුද්ධව මහජනතාවගෙන් ලැබෙන පැමිණිලිවලට යහපත් ප්‍රතිචාර ලැබෙමින් පවතී.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"විශ්වාසනීයවූත්, ශක්තිමත්වූත්, ස්වාධීනවූත්, අපක්ෂපාතීවූත් මහජන හිතකාමීවූත් පොලිස් සේවයක් නිර්මාණය කිරීමට සහය වීම"

මෙහෙවර

"මහජන පැමිණිලි විමර්ශනය තුළින් මානව හිමිකම් සුරකින නීතියේ ආධිපත්‍යයට ගරුකරන ගුණාත්මක පොලිස් සේවයක් නිර්මාණය කිරීමට සහායවීම."

අරමුණු

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකම් සහතික කරනු වස් පොලිස් බලකායට එරෙහිව ඇති මහජන පැමිණිලි විමර්ශනය කර අගතියට පත් පාර්ශවයන්ට සහන සැලසීම.
- මහජන හිතවාදී පොලිස් සේවාවක් නිර්මාණය කරනු වස් පොලිස් නිලධාරීන් වෙනුවෙන් ධනාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පොලිසියට එරෙහි මහජන පැමිණිලි අවම කර පොලිස් සේවාවේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා මහජන සහභාගීත්වය ලබාගැනීමට ක්‍රියාකිරීම.

වටිනාකම්

ස්වාධීනත්වය
අවංකභාවය
වගවීම
අපක්ෂපාතීත්වය
සත්‍යාවාදීභාවය
සුපිළිපන්නභාවය
නීතිගරුකභාවය
සහයෝගීතාව
අවිහිංසාවාදීභාවය
අඛණ්ඩ පුහුණුව
නිර්මාණශීලීත්වය
කඩිනම් ප්‍රතිචාරය
කාර්යක්ෂමතාවය

1.3. ජාතික පොලිස් කොමිෂන් සභාවේ බලතල හා කාර්යභාරය

මෙම වාර්තාවේ සමාලෝචිත කාලය වන 2022 වර්ෂය තුළ ජාතික පොලිස් කොමිෂන් සභාව ක්‍රියාත්මක වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වන සංශෝධනයට අදාල බලතල අනුව වන නිසා ඊට අදාල බලතල පහත සඳහන් වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වන සංශෝධනයේ 155 ඊඊ වගන්තිය ප්‍රකාරව පොලිස් කොමිෂන් සභාව වෙත පවරා ඇති බලතල සහ කාර්යභාරය පහත සඳහන් පරිදිවේ.

"පොලිස් නිලධරයෙකුට හෝ පොලිස් බලකායට එරෙහිව ජනතා සාමාජිකයන්ගෙන් හෝ යම් අතෘප්තියට පත් තැනැත්තෙකුගෙන් හෝ ලැබෙන පැමිණිලි භාර ගැනීම සහ ඒ පිළිබඳ විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවට බලතල ලබාදිය යුතු අතර පාර්ලිමේන්තුව මඟින් පනවන ලද යම් නීතියක විධි විධානවලට අනුකූලව ඒ සම්බන්ධයෙන් සහන සැලසිය යුතු වන්නේ ය. මේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින්, ජනතාසාමාජිකයන්ගෙන් හෝ යම් අතෘප්තියට පත් තැනැත්තෙකුගෙන් ලැබෙන පැමිණිලි භාරගැනීම සඳහා සහ විමර්ශනය කිරීම සඳහා කාර්ය පටිපාටි ස්ථාපිත කිරීමට රීති සාදනු ලැබිය හැකි වන්නේ ය."

1.4. සංවිධාන සටහන


ජාතික පොලිස් කොමිෂන් සභාව
සංවිධාන ව්‍යුහය
කොමිෂන් සභාව
සභාපති
ලේකම්
අධ්‍යක්ෂ
මහජන පැමිණිලි විමර්ශණ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
පාලන, පරිශේෂණ හා සංවර්ධන
ප්‍රධාන ගණකාධිකාරී
ගිණුම්
ජ්‍යෙෂ්ඨ මට්ටම
පළාත් අධ්‍යක්ෂ
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ
ප්‍රධාන විමර්ශන නිලධාරී (කොන්ත්‍රාත්)
සහකාර ලේකම්
නීති නිලධාරී
අභ්‍යන්තර විගණන නිලධාරී
පරිපාලන නිලධාරී
තෘතීක මට්ටම
තො.ස.තා. නිලධාරී
භාෂා පරිවර්තක
විමර්ශණ නිලධාරී/ සංවර්ධන නිලධාරී
විමර්ශණ නිලධාරී/ සංවර්ධන නිලධාරී
විමර්ශණ නිලධාරී/ සංවර්ධන නිලධාරී
මාධ්‍ය නිලධාරී
තො.ස.තා. සහකාර
තො.ස.තා. සහකාර
තො.ස.තා. සහකාර
තො.ස.තා. සහකාර
ක.සේ.නි.
ක.සේ.නි.
කම්වු ලේකම්
දත්ත සටහන් ක්‍රියාකරු
ක.සේ.නි.
ක.සේ.නි.
ක.සේ.නි.
ක.සේ.නි.
ද්විතීයික මට්ටම
රියදුරු සේවය
කාර්යාල සහයක සේවය
ප්‍රාථමික මට්ටම
යතුර - - තො.ස.තා. - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ : ක.සේ.නි. - කළමණාකරණ සේවා නිලධාරී

1.5. කොමිෂන් සභාවේ ප්‍රධාන අංශ

a. පාලන,පර්යේෂණ හාසං වර්ධනඅංශය

b. මහජන පැමිණිලි විමර්ශන අංශය

c. මුල්‍ය අංශය

1.6. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන අරමුදල්

පොලිස් කොමිෂන් සභාවට මෙය අදාළ නොවේ. (ජාතික පොලිස් කොමිෂන් සභාව ජනාධිපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක වේ.)

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු (තිබේනම්)

මේ වන විට විදේශ ආධාර ලබා ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, රතු කුරුස සංවිධානය වැනි ආයතන සමඟ සාකච්ජා පැවැත්වෙන අතර ආධාර ලබා ගැනීම සඳහා උත්සුක වෙමින් සිටී.

02. පරිච්ඡේදය
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

එක් එක්අංශවල ප්‍රගතිය, මුහුණදුන් අභියෝග සහ ඉදිරි ඉලක්ක

2.1 පාලන, පර්යේෂණ හා සංවර්ධන අංශය

2.1.1. පාලන අංශය

ජාතික පොලිස් කොමිෂන් සභාව සතු මානව සම්පත් පරිපාලනය හා කළමනාකරණය, නව නිලධාරීන් බඳවා ගැනීම, ඔවුන්ට අවශ්‍ය පුහුණුවීම් ලබාදීම, කොමිෂන් සභාවට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ එදිනෙදා පරිපාලන කටයුතු ඉටු කිරීම සහ එකී කාර්යන් ඉටු කිරීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා උපකරණ ප්‍රසම්පාදනය පාලන අංශය සතු ප්‍රධාන කාර්යයන් හා වගකීම් වන්නේය.

ජාතික පොලිස් කොමිෂන් සභා කාර්ය මණ්ඩලය, ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රීලංකා ගණකාධිකාරී සේවය වැනි දීප ව්‍යාප්ත සේවාවන්ගෙන් සහ සංවර්ධන නිලධාරී සේවය, රාජ්‍ය කළමනාකරණ සේවය හා තොරතුරු තාක්ෂණ සේවයවැනි ඒකාබද්ධ රාජ්‍ය සේවාවලින් අනුයුක්ත නිලධාරින්ගෙන් සමන්විත වේ. පළාත් අධ්‍යක්ෂ තනතුරු සඳහා විශ්‍රාමික රජයේ විධායක ශ්‍රේණියේ නිලධාරින්ගෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගැනීම් සිදුකර ඇත. නීති නිලධාරි සහ මාධ්‍ය නිලධාරි යන තනතුරු සඳහා පොලිස් කොමිෂන් සභාව විසින් සෘජුවම නිලධාරීන් බඳවාගෙන ඇත. තවද, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙතින්, සේවයේ යෙදී සිටින ස්ථීර නිලධාරීන් ලබාගත නොහැකි වන අවස්ථාවලදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2018 යටතේ, විශ්‍රාමික නිලධාරීන් ද කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ පිහිටුවා පුරප්පාඩු තනතුරුවලට අනුයුක්ත කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වන සංශෝධනය බලාත්මක වීමත් සමඟ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පවරා තිබූ රාජකාරී වපසරිය පුළුල්වීම හේතුවෙන් එකී රාජකාරී කටයුතු කිරීම සඳහා ප්‍රමාණවත් අතිරේක කාර්ය මණ්ඩලයක අවශ්‍යතාවය පැන නැගුණි. ඒ අනුව මේ සම්බන්ධව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමෙන් පසු අතිරේක කාර්ය මණ්ඩලය 2022.12.16 දින අනුමත කරන ලදී. ඒ අනුව 2022.12.31 දිනට ජාතික පොලිස් කොමිෂන් සභාවේ සමස්ථ කාර්ය මණ්ඩලයේ විස්තර පහත පරිදි වේ.

2.1.2. ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල විස්තර 2022.01.01සිට 2022.12.31දක්වා

වගුව **1**

අනු අංකය	තනතුර	සේවය	අනුමත තනතුරු සංඛ්‍යාව	වැටුප් කේතය	සේවයේ නියුතු		
					ස්ථිර	කොන්ත්‍රාත්	පුරප්පාඩු
1	ලේකම්	ශ්‍රී.ලං.ප.සේ. වි.ශ්‍රේ.	01	SL-3	01	-	-
2	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	ශ්‍රී.ලං.ප.සේ .I	01	SL-1	01*	-	-
3	අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.ප.සේ.I	01	SL-1	01	-	-
4	පළාත් අධ්‍යක්ෂ	කොන්ත්‍රාත්	10	60,000/-	-	10	-
5	ප්‍රධාන ගණකාධිකාරි	ශ්‍රී.ලං.ග.සේ. I	01	SL-1	01	-	-
6	අභ්‍යන්තර විගණක	ශ්‍රී.ලං.ග.සේ.II/III	01	SL-1	-	-	01
7	සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී.ලං.ප.සේ II/III	02	SL-1	01	-	01
8	සහකාර ලේකම්	ශ්‍රී.ලං.ප.සේ III	01	SL-1	-	-	01
9	නීති නිලධාරී	දෙපාර්තමේන්තුගත	01	SL-1	01	-	-
10	ප්‍රධාන විමර්ශන නිලධාරි	කොන්ත්‍රාත්	01	60,000/-	-	-	01
එකතුව			**20**		**06**	**10**	**04**
11	පරිපාලන නිලධාරි	ක.සේ. නිල. අධි	01	MN-7		-	01
12	භාෂා පරිවර්තක සි/ඉ	භා.ප.සේ.	01	MN-6		-	01
13	භාෂා පරිවර්තක සි/දෙ	භා.ප.සේ.	01	MN-6	01	-	-
14	තොරතුරු තාක්ෂණ නිලධාරී	තො.තා.සේ.	01	MN-6	01	-	-
එකතුව			**04**		**02**	**-**	**02**
15	මාධ්‍ය නිලධාරි	දෙපාර්තමේන්තුගත	01	MN-4	01	-	-
16	විමර්ශන නිලධාරී	දෙපාර්තමේන්තුගත	12	MN-4	12	-	-
17	සංවර්ධන නිලධාරී	සංවර්ධන නිලධාරී සේවය	12	MN-4	12	-	-
18	කළමනාකරණ සේවා නිලධාරී	ක.සේ.නිල.සේවය	22	MN-2	20	01	01

19	විමර්ශන සහායක	කොන්ත්‍රාත්	03	30,000/-	-	-	03
20	තොරතුරු තාක්ෂණ සහකාර	තො.තා.සේ.	04	MT-1	04	-	-
21	කම්ටු ලේකම්	කොන්ත්‍රාත්	01	50,000/-	-	01	-
එකතුව			**55**		**49**	**02**	**04**
22	දත්ත සටහන් ක්‍රියාකරු	දෙපාර්තමේන්තුගත	01	MN-1	01	-	-
23	රියදුරු	රියදුරු සේවය	06	PL-3	04	-	02
24	කාර්යාල කාර්ය සහායක සේවය	කා.කා.සේ.	13	PL-1	11	-	02
එකතුව			**20**		**16**	**-**	**04**
මුළු එකතුව			**99**		**73**	**12**	**14**

2.1.3. 2022 වර්ෂයේ නිලධාරීන් පුහුණු පාඨමාලා සඳහා සහභාගී කරවීම.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය උදෙසා 2022 ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා වන කාලය තුල ආයතනයේ සියලු කාර්ය මණ්ඩලය ඇතුලත්වන පරිදි නිලධාරීන්ගේ ඉල්ලීම මත පුහුණු පාඨමාලා සඳහා සහභාගී කරවා ඇත. මේ සඳහා රු. 212,500.00 ක මුදලක් වියදම් දරා ඇත. නිලධාරීන් 18 දෙනෙකු පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවා ඇති අතර එකී නිලධාරීන්ගේ නාම ලේඛනය හා පුහුණු පාඨමාලා තොරතුරු පහත පරිදි වේ.

පුහුණු පාඨමාලාව සඳහා සහභාගීත්වය - 2022

වගුව 2

	නම	තනතුර	පුහුණු පාඨමාලාව	පාඨමාලා ගාස්තුව
1	ඒ.එන්. දර්ශනී මිය	කළමනාකරණ සේවා නිලධාරී	නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම දින 02	රු.8500/-
2	ඒ.එස්.පී. අතුකෝරාළ මිය	කළමනාකරණ සේවා නිලධාරී	වාර්ෂික වත්කම් සමීක්ෂණය හා වත්කම් අපහරණය - දින 02	රු.8500/-
3	කේ. ප්‍රේමකුමාර මහතා	කළමනාකරණ සේවා නිලධාරී	පුවාහන කළමනාකරණය (මාර්ගගත ක්‍රමය) - දින 02	රු.7000/-
4	ජානක සමන්ත කුමාර හේරත් මයා	රියදුරු	කාර්යාල කාර්ය සහයකයින් හා රියදුරන්ගේ ආකල්ප හා වෘත්තිය දැනුම ඉහළ නැංවීම- දින 02	රු.8500/-
5	ඩබ්ලිව්.ඒ.එස්. ප්‍රනාන්දු මහතා	කාර්යාල කාර්ය සහයක සේවය	කාර්යාල කාර්ය සහයකයින් හා රියදුරන්ගේ ආකල්ප හා වෘත්තිය දැනුම ඉහළ නැංවීම- දින 02	රු.8500/-
6	අසිරු ලන්සකාර මහතා	කාර්යාල කාර්ය සහයක සේවය	කාර්යාල කාර්ය සහයකයින් හා රියදුරන්ගේ ආකල්ප හා වෘත්තිය දැනුම ඉහළ නැංවීම- දින 02	රු.8500/-
7	රුවනි ජයවර්ධන මිය	කාර්යාල කාර්ය සහයක සේවය	කාර්යාල කාර්ය සහයකයින් හා රියදුරන්ගේ ආකල්ප හා වෘත්තිය දැනුම ඉහළ නැංවීම- දින 02	රු.8500/-
8	ඒ.ආර්.එස්. සෙව්වන්දි මෙය	කළමනාකරණ සේවා නිලධාරී	වර්තමාන කාර්යාල ක්‍රම හා කාර්යාල කළමනාකරණය- දින 02	රු.7500/-
9	ඒ.එන්. දර්ශනී මිය	කළමනාකරණ සේවා නිලධාරී	චිනය කාර්ය පටිපාටිය - දින 02	රු.8500/-
10	සුභානි ගමගේ මිය	නීති නිලධාරී	ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාව III අදියර - මාස 6 1/2	රු.25000/-

11	චාමිකා සුබෝධිනි මිය	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාව- මාස 6 1/2	රු.25000/-
12	ඩබ්ලිව්.එම්.ඩී.කේ. වික්‍රමසිංහ මිය	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාව- මාස 6 1/2	රු.25000/-
13	බී.එල්.ඩී. ප්‍රවිනි මිය	ප්‍රධාන ගණකාධිකාරී	ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාව - මාස 6 1/2	රු.25000/-
14	වයි.ජී.ආර්.පී. පෙරේරා මහතා	සහකාර ලේකම්	ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාව - මාස 6 1/2	රු.25000/-
15	තනූජා ප්‍රනාන්දු මිය	අධ්‍යක්ෂ/ මහජන පැමිණිලි විමර්ෂණ	ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාව - මාස 6 1/2	රු.25000/-
16	අයි.එම්.ජී.අයි. ගමගේ මිය	විමර්ෂණ නිලධාරී	ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාව - මාස 6 1/2	රු.25000/-
17	බී.සී.ඩී. ප්‍රනාන්දු මහතා	දුරකථන ක්‍රියාකරු	Telephone Skills & Etiquette(මාර්ගගත) - දින 02	රු.8500/-
18	කේමින්ද රුබේරු මහතා	තොරතුරු තාක්ෂණ නිලධාරී	දෙමළ භාෂා පුහුණු පාඨමාලාව - පැය 200	රු.8500/-

2.1.4. 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත අනුව තොරතුරු ලබාදීම.

2022.01.01 දින සිට 2022.12.31 දින වන විට ඉහත පනත යටතේ ලබාදුන් තොරතුරු පිළිබඳ සංඛ්‍යාලේඛන පහත පරිදි වේ.

ලැබුණු තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව	34
තොරතුරු ලබාදුන් ඉල්ලීම් සංඛ්‍යාව	26
ප්‍රතික්ෂේප කර ඇති ඉල්ලීම් සංඛ්‍යාව	06
තොරතුරු ලබාදීමට කටයුතු කරමින් සිටින සංඛ්‍යාව	02

2.1.5. පර්යේෂණ හා සංවර්ධන අංශය

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ආරම්භ කර ඇති නව වැඩසටහන් සැලසුම් කිරීම, සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීමට ලක් කිරීම මෙම අංශය සතු ප්‍රධාන කාර්යය සහ වගකීම වන්නේය. ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ලැබෙන ලිපි, මහජන පැමිණිලි ආදිය වර්ගීකරණය කොට සවිස්තරාත්මක විශ්ලේෂණ වාර්තාවක් මාසිකව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම පර්යේෂණ අංශය මගින් සිදුකරනු ලබන අතර, යම් ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධ තීරණවලට එළඹීමේදී එකී සංඛ්‍යා දත්ත පදනම් කරගනු ලබයි. කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඒකකය මෙම අංශය යටතේ ක්‍රියාත්මක වේ.

2.1.6. මාධ්‍ය ඒකකය

දිනපතා පළවන මාධ්‍ය වාර්තා පදනම් කරගනිමින් සතිපතා කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලබන අතර, මෙම අංශය මගින් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යකරුවන් සහ ආයතන සමඟ යහපත් සම්බන්ධතා වැඩිදියුණු කර ගැනීමට කටයුතු කරයි. එසේම කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් වරින්වර මාධ්‍ය නිවේදන නිකුත් කරනු ලබන අතර මහජනයා හා පොලිස් නිලධාරින් දැනුවත් කිරීම ඉලක්ක කර ගනිමින් මාධ්‍ය සාකච්ජා සංවිධානය කරනු ලබයි. ඊට අමතරව උපායමාර්ග සැලසුම් සකස් කිරීම, වාර්ෂික කාර්ය සාධන වාර්තා සකස් කිරීම, කාර්තු වාර්තා සකස් කිරීම වැනි කොමිෂන් සභාවේ සියලු ප්‍රලේඛන කටයුතු ද මෙම අංශය මඟින් ඉටු කරයි.

2.1.7. ජාතික පොලිස් කොමිෂන් සභාවේ මාධ්‍ය අංශය විසින් සම්බන්ධීකරණය කරන ලද විද්‍යුත් මාධ්‍ය (රූපවාහිනී, ගුවන් විදුලි) වැඩසටහන් 2022.01.01- 2022.12.31 දක්වා

වගුව 3

	මාධ්‍ය ආයතනය සහ වැඩසටහන	සහභාගීත්වය	දිනය (විකාශය/ පටිගත කළ දිනය)	වැඩසටහන් කාලය
1	ගුවන්විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවයේ ‘‘සුභාරතී’’ සංවාද මණ්ඩපය	එස්. ලියනගම මහතා සහ ප්‍රියන්ත සංජීව මහතා (කොමිෂන් සභාවේ සාමාජිකයින්)	2022 ජුනි 24 උදෑසන 7-8	පැය 01
2	ජාතික රූපවාහිනි සේවයේ ‘‘ආයුබෝවන්’’ සජීවී වැඩසටහන	එස්. ලියනගම මහතා සහ ප්‍රියන්ත සංජීව මහතා (කොමිෂන් සභාවේ සාමාජිකයින්)	2022 ජුනි 26 උදෑසන පැය 8.00 – 8.30	මිනිත්තු 30
3	ස්වාධීන රූපවාහිනී සේවයේ “ 7 වන පැය ” වැඩසටහන	චන්ද්‍රා ප්‍රනාන්දු මහතා (සභාපති ජා.පො.කොා.) සහ පී.ඩී. ලියනාරච්චි මහතා (මාධ්‍ය නිලධාරී ජා.පො.කොා.)	2022 සැප්තැම්බර් 20 උදෑසන පැය 7.00 – 8.00	පැය 01
4	සිරස මාධ්‍යය ජාලයේ T.VI නාලිකාවේ “ ජාතික මෙහෙවර” වැඩසටහන	අයි. එම්. කරුණාරත්න මයා (මධ්‍යම පළාත් අධ්‍යක්ෂ I) අජිත් ගුණසේකර මහතා (මධ්‍යම පළාත් අධ්‍යක්ෂ II)	2022 ඔක්තොම්බර් 07 රාත්‍රී 9.00 – 10.00 සිරස - උදෑසන 10.00 – 11.00	පැය 01
5	සිරස රූපවාහිනියේ උදෑසන ‘‘පැතිකඩ’’ වැඩසටහන	චන්ද්‍රා ප්‍රනාන්දු මහතා (සභාපති ජා.පො.කොා.)	2022 සැප්තැම්බර් 30 දින පටිගත කළ අතර 2022 ඔක්තොම්බර් 07 දින විකාශනය විය.	මිනිත්තු 30

2.1.8. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඒකකය

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම හා සම්බන්ධ කටයුතු ඉටු කිරීම මෙම ඒකකයට පැවරී ඇති රාජකාරියයි. නව වෙබ් අඩවිය නිර්මාණය කිරීම, එය යාවත්කාලීනව භාවිත කරන්නාට පහසු වන ආකාරයට පවත්වාගෙන යාමත් මෙම අංශයේ වගකීම වේ.

2.1.9. නීති අංශය

ජාතික පොලිස් කොමිෂන් සභාවෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වන සංශෝධනය ප්‍රකාරව ලබා දී ඇති බලතල අනුව මහජනතාවට පොලිස් නිලධාරීන්ගෙන් හෝ පොලිස් බලකාය මගින් සිදුවන අගතිය සම්බන්ධව ලැබෙන මහජන පැමිණිලි විමර්ශනය කිරීම සිදු කරනු ලබන අතර එකී පැමිණිලි විමර්ශනය සිදු කරනු ලබනුයේ මහජන පැමිණිලි විමර්ශන අංශය විසිනි. මහජන පැමිණිලි විමර්ශන අංශය මගින් මෙම මහජන පැමිණිලි විමර්ශනයේ දී මතුවන ගැටළුවලදී ඒ ආශ්‍රයෙන් පැන නගින නෛතික තත්ත්වයන් සම්බන්ධව උපදෙස් ලබා දීම නීති අංශය මගින් සිදු කරනු ලබයි.

සභාපතිතුමාගේ මාර්ගෝපදේශයන් යටතේ මහජන පැමිණිල්ලක් සම්බන්ධව ක්‍රියා කිරීමේදී මතුවන නෛතික ගැටලු විසඳා ගැනීම සම්බන්ධව සෑම විමර්ශන නිලධාරියෙකුටම සතියකට දින තුනක පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ සභාපතිතුමාගේ මාර්ගෝපදේශය යටතේම ශ්‍රී ලංකාවේ නීති ක්ෂේත්‍රය තුල නෛතික විවාදයට ලක්වන නීතිමය ගැටළු සම්බන්ධව අධ්‍යයනය කර එම වාර්තා ඉදිරිපත් කිරීම සිදු කරනු ලබයි.එසේම ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ නඩු සම්බන්ධව ගරු නීතිපතිතුමා සමග සාකච්ඡා කරමින් අදාල ලේඛන ඉදිරිපත් කිරීම නීති අංශය විසින් සිදු කරනු ලබයි.

2.2. මහජන පැමිණිලි විමර්ශන අංශය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනයේ 155 ඊඊ වගන්තිය යටතේ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පැවරී ඇති එකම සහ ප්‍රධානතමකාර්යය වන පොලිස් නිලධාරියෙකුට හෝ පොලිස් බලකායට එරෙහිව ලැබෙන මහජන පැමිණිලි භාරගෙන විමර්ශනය කිරීම හා සහන සැලසීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය හා වගකීම වේ. 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන්ද එම බලතල එලෙසම නොවෙනස්ව බලපැවැත්වේ. මහජන පැමිණිලි විමර්ශන අංශය වෙත ලැබෙන පැමිණිලිවල විමර්ශන කටයුතු සම්බන්ධයෙන් වන ප්‍රගතිය කොමිෂන් සභාව වෙත වාර්තා කිරීමද මෙම අංශය මගින් සිදුකරනු ලබයි.

මෙම අංශයේ ප්‍රධානියා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 පංතියේ නිලධාරියෙකු වන අතර ඔහු/ ඇය අධ්‍යක්ෂ ලෙසද, එම සේවයේ 11/111 පන්තියේ නිලධාරීන් දෙදෙනෙකු නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ ලෙසද තනතුරු දරනු ලබයි. නමුත් පසුගිය වසර පුරාම නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ එක් තනතුරක් පුරප්පාඩුව පැවතුනි. පළාත් අධ්‍යක්ෂවරුන් දස දෙනෙකුගේ අධීක්ෂණය යටතේ කොමිෂන් සභාවේ පළාත් කාර්යාල 09 ක් ක්‍රියාත්මක වන අතර වැඩිම පැමිණිලි ප්‍රමාණයක් ලැබෙන බස්නාහිර පළාත සඳහා පළාත් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සිටිති. එම කාර්යාල මඟින් ද මහජන පැමිණිලි භාර ගැනීම සිදු කරනු ලබයි. සමාලෝචිත කාලය තුළ පළාත් අධ්‍යක්ෂවරුන් ඔවුන් වෙත කෙළින්ම ලැබුණු පැමිණිලි සහ ප්‍රධාන කාර්යාලයෙන් යවන ලද පැමිණිලි සම්බන්ධ විමර්ශන පැවැත්වීමට කටයුතු කර ඇත.

පොලිස් නිලධාරින්ට සහ පොලිස් සේවයට එරෙහි මහජන පැමිණිලි භාර ගැනීමත්, විමර්ශනය කිරීමත් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයෙහි පිහිටි ප්‍රධාන කාර්යාලයේ මහජන පැමිණිලි විමර්ශන අංශය විසින් සහ පළාත් කාර්යාල වලින් සිදු කරයි.

2.2.1. මහජන පැමිණිලි විමර්ශන අංශය මඟින් ඉටු කරනු ලබන සේවාවන්

- පැමිණිලි භාර ගැනීම.
- විමර්ශනය කිරීම.
- පැමිණිලිකරු දැනුවත් කිරීම.
- පොලිස් නිලධාරියෙකුගෙන් හෝ පොලිස් සේවයෙන් යම් කිසි රාජකාරි පැහැර හැරීමක් හෝ විනය විරෝධී කටයුත්තක් සිදුවී ඇත්නම් ඒ පිළිබඳ විනයානුකූලව කටයුතු කිරීමට පොලිස්පති හෝ අදාල බලධාරීන් වෙත යොමු කිරීම.
- මහජන පැමිණිලි සම්බන්ධයෙන් පොලීසිය විසින් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව පොලිස් නිලධාරීන්ට උපදෙස් ලබාදීම.
- අංශයේ නිලධාරීන් පුහුණු කිරීම.
- පැමිණිලි සිදු කරන ආකාරය පිළිබඳ ජනතාවට මාර්ගෝපදේශ ලබාදීම.
- කොමිෂන් සභාවට අදාළ නොවන පැමිණිලි සඳහා පැමිණිලිකරුවන්ව නිසි ස්ථාන වෙත යොමු කිරීම.
- 1960 ක්ෂණික ඇමතුම් සේවය මඟින් පැය 24 පුරාම පැමිණිලිකරුවන්ට ක්ෂණික සහන ලබාදීම.

2.2.2. 2022 වර්ෂයේ මහජන පැමිණිලි විමර්ශන අංශයේ කාර්ය සාධනය

2020 දෙසැම්බර් මස පත්වූ 06 වන ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් 2021වසරේදී හඳුන්වා දුන් නව මහජන පැමිණිලි විමර්ශන ක්‍රමවේදය 2022 වර්ෂයේදී වඩාත් ක්‍රමවත්ව සහ විධිමත්ව පවත්වාගෙන යන ලදී. විමර්ශන නිලධාරීන් මෙන්ම පළාත් අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ (මහජන පැමිණිලි විමර්ශන) විසින්ද එම විමර්ශන ක්‍රමවේදය කොමිෂන් සභාවේ උපදෙස් පරිදි සහ වරින් වර කොමිෂන් සභාව මඟින් ලබාදෙන නියෝග පරිදි කරගෙන යන ලදී.

ඒ අනුව පහත කාර්යයන් ඉටු කරන ලදී.

1. **නව පැමිණිලි භාර ගැනීම.**

   පොලිස් නිලධාරියෙකු හෝ පොලිස් සේවය මඟින් යම් අසාධාරණයක් සිදු වූ මහජනයාගෙන් කෙනෙක් හෝ සිවිල් සංවිධානයක් හෝ ඔවුන්ගේ නියෝජිතයෙක්/ නීතීඥවරයෙක් විසින් ඉදිරිපත් කරන පැමිණිලි භාරගනු ලබයි.

   - ❖ පැමිණිලි ලැබෙන ක්‍රමවේදය.

     I. තැපෑල මඟින් යොමු කිරීමෙන්.
     II. 1960 ක්ෂණික ඇමතුම් සේවයට දැනුම් දීම මඟින්.
     III. ෆැක්ස් කිරීම මඟින්.

IV. විද්‍යුත් තැපෑල මඟින්.

V. මහජන පැමිණිලි කළමනාකරණ පද්ධතිය වෙත ඇතුලත් කිරීම මඟින්

VI. පැමිණ භාරදීම මඟින්.

2. පැමිණිලි විමර්ශනය කිරීම.

- ❖ නව පැමිණිලි සභාපතිතුමා වෙත යොමු කරයි.
- ❖ ඒ සියල්ල අධ්‍යයනය කර විමර්ශනයට අවශ්‍ය උපදෙස් සමග ප්‍රධාන කාර්යාලයේ සිටින පළාත් සම්බන්ධීකරණය සිදු කරන නිලධාරියාට හෝ බස්නාහිර පළාතේ පැමිණිල්ලක් නම් කෙලින්ම අදාල නිලධාරින්ට සභාපතිතුමා විසින් පැමිණිලි ලබාදෙයි.
- ❖ එම විමර්ශන නිලධාරින් විසින් අදාල පළාත් කාර්යාලයෙන් අංකයක් ලබාගැනීමෙන් පසු විමර්ශන සැලැස්මේ කෙටුම්පතක් සකස් කර සභාපතිතුමා වෙත ඉදිරිපත් කරයි.
- ❖ සභාපතිතුමාගේ උපදෙස් පරිදි සියලු පැමිණිලි පළාත් සම්බන්ධීකරණ නිලධාරින් මඟින් පළාත් කාර්යාල වෙත යොමු කරයි. බස්නාහිර පළාතේ පළාත් අධ්‍යක්ෂ වෙත ලබා දෙයි.
- ❖ පැමිණිල්ලේ ස්වභාවය අනුව විමර්ශන නිලධාරින් විසින් විමර්ශන සැලැස්මක් සකස් කිරීම.
- ❖ විමර්ශන කටයුතු අදාල පළාත් කාර්යාලය විසින් සිදුකරන අතර ඔවුන්ට අවශ්‍ය උපදෙස් මගපෙන්වීම් ප්‍රධාන කාර්යාලයේ අධ්‍යක්ෂ (මහජන පැමිණිලි විමර්ශන) හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පළාත් විමර්ශන) මඟින් ලබාදෙයි.
- ❖ ප්‍රධාන කාර්යාලයේ සිටින පලාත් සම්බන්ධීකරණ නිලධාරීන් පළාත් කාර්යාලය හා ප්‍රධාන කාර්යාලය අතර එම පළාතට අදාල ලිපිගොනු නඩත්තු කිරීම සිදුකරයි.

3. විමර්ශන අවසන් කිරීම.

- පළාත් අධ්‍යක්ෂ මඟින් විමර්ශන අවසන් කළ හැකි සියළු පැමිණිලි වලට අදාල පළාත් අධ්‍යක්ෂගේ නිර්දේශිත වාර්තාව සහිත වූ ගොනු ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරයි.

- සභාපතිතුමා විසින් එය අවසන් කල හැකිදැයි පරීක්ෂා කර, තවදුරටත් වාර්තා කැඳවිය යුතුනම් පළාත් සම්බන්ධීකරණ නිලධාරි වෙතටද අවසන් කල හැකිනම් සභාපතිතුමා විසින්ම විමර්ශන අවසන් කරන බවට පැමිණිලිකරු වෙත දැනුම් දී කොමිෂන් පත්‍රිකාව සකස් කර කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මහජන පැමිණිලි විමර්ශන වෙත උපදෙස් ලබා දෙයි.

- 2022.10.27 වන දින පැවති 70 වෙනි කොමිෂන් සභා රැස්වීම් වාරයේ සිට විමර්ශන අවසන් කරන බව පැමිණිලිකරුට දැනුම්දීමේ ලිපිය අධ්‍යක්ෂ (මහජන පැමිණිලි විමර්ශන) විසින් යොමු කර ඉන්පසු එම ලිපියේ පිටපතක්ද සහිතව විමර්ශන අවසන් කිරීමේ නිර්දේශද ඇතුලත් කර සකසන ලද කොමිෂන් පත්‍රිකා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු බවට කොමිෂන් සභාව විසින් නියෝග ලබා දුනි. ඒ අනුව එතැන් පටන් විමර්ශන අවසන් කිරීමේ ක්‍රමවේදය සංශෝධනය විය.

- අධ්‍යක්ෂ විසින් විමර්ශන අවසන් කිරීමට අදාල නිර්දේශ සහිත කොමිෂන් පත්‍රිකාව සකස් කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරයි.

- කොමිෂන් සභාවේ තීරණය පරිදි විමර්ශන කටයුතු අවසන් කිරීම හෝ සභාවේ උපදෙස් මත තව දුරටත් විමර්ශනය කිරීම සිදු කරයි.

4. සේවාස්ථ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

නව ක්‍රමවේදය අනුව විමර්ශන කටයුතු සිදු කිරීමත්, විමර්ශන කටයුතු කඩිනම් කිරීමත් සඳහා නිලධාරීන් තුල තිබෙන දැනුම සහ තවදුරටත් අවශ්‍යවන දැනුම පිළිබඳව නීති නිලධාරී මඟින් සතිපතා පුහුණු වැඩසටහන් පවත්වන ලදී. ඒ අනුව ඔවුන්ගේ දැනුවත් කළ යුතු, පුහුණු කල යුතු සහ ධාරිතා සංවර්ධනය කළ යුතු අංග හඳුනා ගන්නා ලදී.

5. තොරතුරු/ සංඛ්‍යාලේඛන වාර්තා සැදීම.

අංශය මඟින් පහත තොරතුරු වාර්තා කාලීනව සහ අවශ්‍යතාවය පරිදි සකසනු ලබයි.

- සතිවාර්තාව මගින් සතිපතා කොමිෂන් සභාවට නව පැමිණිලි ඉදිරිපත් කිරීම.
- නිලධාරීන්ගේ දෛනික රාජකාරී වාර්තා
- කොමිෂන් සභා තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති වාර්තා
- කොමිෂන් පත්‍රිකා
- මාසික, ත්‍රෛමාසික, අර්ධ වාර්ෂික සහ වාර්ෂික ප්‍රගති වාර්තා
- ලැබෙන පැමිණිලි, පැමිණිලි වල ස්වභාවය අනුව වාර්තා
- පොලිස් ස්ථානය අනුව ලැබී ඇති වාර්තා
- විගණන කටයුතු සඳහා ලබාදිය යුතු වාර්තා
- පාර්ලිමේන්තුව වෙත ලබාදිය යුතු ප්‍රගති වාර්තා

6. තොරතුරු පනත සඳහා අවශ්‍ය ලේඛන සැපයීම.

අප සතුව ඇති ලේඛන හෝ තෙවන පාර්ශවයකට අදාල ලේඛන තොරතුරු පනතේ විධිවිධාන වලට යටත්ව ලබාදීම.

2.2.3. 1960 ක්ෂණික ඇමතුම් සේවය.

මහජනතාවට ජාතික පොලිස් කොමිෂන් සභාවට පැමිණිලි ඉදිරිපත් කිරීමට පහසුවනු වස් 0710361010 සමඟ අංක හතරකින් යුත් දවසේ පැය 24 ක්‍රියාත්මක වන මහජන ඇමතුම් අංකයක් ලෙස 1960 හඳුන්වා දීම. ඉන්පසුව කොමිෂන් සභාවේ අඛණ්ඩ ක්‍රියාකාරීත්වය තුල මහජන පැමිණිලි විමර්ශන අංශයේ විමර්ශන නිලධාරීන්ගේ සක්‍රීය දායකත්වය මත මෙම 1960 ක්ෂණික ඇමතුම් සේවය දවසේ පැය 24 පුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ වත්මන් සභාපතිතුමාගේ පූර්ණ අධීක්ෂණය යටතේ 1960 ක්ෂණික ඇමතුම් සේවාව ක්‍රියාත්මක වේ.

දවසේ ඕනෑම වේලාවක මහජනතාවට නාමිකව හෝ නිර්නාමිකව වාචික පැමිණිලි ඉදිරිපත් කළ හැකි වන අතර එම පැමිණිල්ල පටිගතවේ. ඉන් අනතුරුව විමර්ශන නිලධාරී විසින් ඊට අදාල ඉදිරි පියවර ගන්නා අතර නිර්නාමිකව ලද පැමිණිල්ලක් නම් පැමිණිලිකරුගේ රහස්‍යභාවය සුරක්ෂිත වන ආකාරයට කටයුතු කර ඉදිරි පියවරයන් සඳහා යොමු කරනු ඇත.

2.2.4. 1960 ක්ෂණික ඇමතුම් සේවය ක්‍රියාත්මක කරනු ලබන විමර්ශන නිලධාරීන් විසින් ගනු ලබන ක්‍රියාමාර්ග.

- පැමිණිලිකරුට සාවදානව ඇහුම්කන්දී ලද පැමිණිල්ල සටහන් කර ගැනීම.
- ඉදිරිපත් වී ඇති කරුණු මත ක්ෂණිකව ක්‍රියාත්මක විය යුතු කරුණක් නම් පොලිස් ස්ථානාධිපතිවරයා වෙත හෝ රාජ්‍ය නිවේදිත නිලධාරියෙකු වෙත වාචිකව පැමිණිල්ල යොමු කිරීම.
- එසේ නොමැති නම් පැමිණිල්ලෙහි සාරාංශයක් ගෙන පොලිස් ස්ථානාධිපතිවරයා වෙත විද්‍යුත් තැපෑල මඟින්/ ෆැක්ස් මඟින් හෝ වට්ස් ඇප් මඟින් ලිඛිතව දැනුම්දීම. එසේ අපහසු වූ අවස්ථාවක දුරකථන පණිවුඩයක් මඟින් දැනුම් දීම. (TR)
- සිද්ධියට අදාලව පැය 24ක් තුල ස්ථානාධිපතිවරයාගෙන් වාර්තාවක් ලබා ගැනීම.
- එම වාර්තාවේ සඳහන් කරුණු පැමිණිලිකරුට දැනුම් දීම.
- පැමිණිලිකරු එම කරුණු හා එකඟ නොවේ නම් විස්තරාත්මකව ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දීම.
- ඉහත ආකාරයෙන් ලැබෙන පැමිණිලි පිළිබඳව දෛනික වාර්තාවක් සකස් කර පොලිස් කොමිෂන් සභාවේ සභාපතිතුමා වෙත දෛනික සාරාංශයක් ඉදිරිපත් කිරීම.
- සභාපතිතුමාගෙන් ලද උපදෙස් අනුව ලැබෙන පැමිණිල්ලට අදාලව ඉදිරි විමර්ශන සඳහා යොමු කිරීම.

2.2.5. 1960 ක්ෂණික ඇමතුම් ක්‍රියාකිරීත්වය පිළිබඳ සංඛ්‍යා ලේඛනමය විස්තර සහ ඉටු කර ඇති ක්‍රියාකාරකම්.

2022 වර්ෂයේ දී 1960 ක්ෂණික ඇමතුම් සේවය වෙත ලැබුණු පැමිණිලි සංඛ්‍යාව වර්ගීකරණය කර පහත වගුව පරිදි දක්වා ඇත.

2022.01.01 – 2022.12.31 දින දක්වා 1960 වෙත ලද පැමිණිලි

වගුව 4

මාසය	කොමිෂන්සභා විෂය පථයට අදාලව ලද මුළු ඉල්ලීම් සංඛ්‍යාව	පැමිණිලි පොලිස් ස්ථානාධිපති වෙත /පොලිස් අධිකාරි සහ වෙනත් ස්ථාන වෙත ඉදිරිපත් කර ක්ෂණිකව සහන ලබා දුන් සංඛ්‍යාව	ක්ෂණිකව සහන ලබාදිය නොහැකි ගැටළු සඳහා ඉදිරි කටයුතු සඳහා උපදෙස් ලබා දුන් සංඛ්‍යාව	මහජනයා විසින් කරන ලද වෙනත් ඉල්ලීම් වලින් අදාල අංශවෙත යොමු කල සංඛ්‍යාව	ක්ෂණික ඇමතුමට ලද මුළු ඉල්ලීම්සංඛ්‍යාව
ජනවාරි	595	88	507	350	945
පෙබරවාරි	595	93	502	300	895
මාර්තු	532	84	448	422	954
අප්‍රේල්	418	82	336	326	744
මැයි	297	138	159	411	708
ජුනි	370	104	266	376	746
ජුලි	506	72	434	423	929
අගොස්තු	330	74	256	396	726
සැප්තැම්බර්	358	57	301	351	709
ඔක්තෝබර්	404	69	335	401	805
නොවැම්බර්	453	68	385	394	847
දෙසැම්බර්	307	66	241	459	766
එකතුව	**5165**	**995**	**4170**	**4609**	**9774**

වගුව 1 – 2022 වර්ෂයට අදාලව මහජන පැමිණිලි විමර්ශන අංශයේ ක්ෂණික ඇමතුම් සේවය වෙත මුළු ඉල්ලීම් 9774 ක් පමණ ලැබී ඇත. ඉන් ජාතික පොලිස් කොමිෂන් සභාවේ විෂය පථයට අදාලව පැමිණිලි 5165ක් ලැබී ඇත. පොලීසියට එරෙහිව මහජනතාවගෙන් ලද මුළු ඉල්ලීම් සංඛ්‍යාවෙන් පොලිස් නිලධාරීන්ට එරෙහිව මහජනතාව විසින් පැමිණිලි 4170ක් ඉදිරිපත් කර ඇත. එම පැමිණිලි පොලිස් ස්ථානාධිපති වෙත / පොලිස් අධිකාරී සහ වෙනත් ස්ථාන වෙත ඉදිරිපත් කර ක්ෂණිකව සහන ලබා දුන්

සංඛ්‍යාව පැමිණිලි 995ක් වන අතර 4170ක ප්‍රමාණයක් සඳහා ඉදිරි උපදෙස් ලබා දී ඇත. ලද පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පනවා ඇති වගන්ති ප්‍රකාරව අවශ්‍ය ක්ෂණික සහන සලසා දීමට කටයුතු කර ඇත.

ප්‍රස්තාරය 1



ප්‍රස්තාරය 1 – 1960 ක්ෂණික ඇමතුම් සේවය වෙත 2022.01.01 – 2022.12.31 දින දක්වා 1960 වෙත මාසිකව ලද පැමිණිලි සහ එයට ගත් ක්‍රියාමාර්ග පිළිබඳ සංඛ්‍යාලේඛන ප්‍රස්තාරය මඟින් පෙන්නුම් කර ඇත.

ප්‍රස්තාරය 2



2.2.6. මුහුණ දුන් අභියෝග

01. 1960 ක්ෂණික ඇමතුම් සේවාවට අදාල පැමිණිලි සම්බන්ධව තොරතුරු සහ වෙනත් සේවාවන් ශ්‍රී ලංකා පොලීසිය වෙතින් ලබා ගැනීමේදී දුෂ්කරතා සහ බාධක ඇතිවූ නමුත් එම අභියෝගයන්ට මුහුණදෙමින් මෙම ඇමතුම් සේවයෙහි රාජකාරි කටයුතු නොපසුබටව ඉටු කරන ලදී.
02. දිවා කාලය තුල සේවය කිරීමේදී රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී 1 වෙතින් මනා සහයෝගයක් ලැබී ඇත.
03. පැය 24 හිම කටයුතු කරනු ලබන සේවයක් වන හෙයින් රාත්‍රී කාලයේද ලැබෙන පැමිණිලි පොලිස් ස්ථානාධිපති වෙත හෝ උසස් පොලිස් නිලධාරීන් වෙත යොමු කරනු ලබන අතර හැකි ආකාරයකින් මහජනතාව වෙත සහන සලසා දීමට කටයුතු කර ඇත.
04. සමහර පැමිණිලිකරුවන් සත්‍ය කරුණු ලෙස ලබා දෙනු ලබන අසත්‍ය පණිවුඩ පොලිස් ස්ථාන වෙත යොමු කිරීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වුනි.

05. 1960 පැමිණුලිකරුවන්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකි සේවයක් වන හෙයින් යම් යම් අවස්ථාවල රාත්‍රී කාලයේදී බීමත් පුද්ගලයින්ගේ අසභ්‍ය වචන සහ බැනුම් පැමිණිලි ලෙස ලැබීම නිසා අපහසුතාවයට පත්වීම.
06. පොලිස් ස්ථාන වෙත පැමිණිලි යොමු කිරීමේදී හඳුන්වා දී ඇති VPN පද්ධතිය ඵලදායී සහ කාර්යක්ෂමව ක්‍රියාත්මක නොවීම හේතුවෙන් වාර්තා ලබා ගැනීමේ දී ප්‍රමාදයක් සිදුවීම.

2.2.7. ලබා ඇති ජයග්‍රහණ

01. 2022 වර්ෂයට අදාලව එක්සත් මානව හිමිකම් සංවිධානය විසින් ලබා දුන් හොඳම උපකාරක සේවයට හිමි Voice for Voiceless සම්මානය 1960 වෙනුවෙන් ජාතික පොලිස් කොමිෂන් සභාවට ලැබී ඇත.
02. ජාතික පොලිස් කොමිෂන් සභාවේ 1960 ක්ෂණික ඇමතුම් සේවය 2013 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූවද ඊට අදාලව විධිමත් ක්‍රියා සැලැස්මක් ආරම්භ වූයේ 2021 වර්ෂයේ මැද භාගයේ සිට වන අතර මේ වන විට ඊට අදාලව මහජනතාවගෙන් යහපත් ප්‍රතිචාර ලැබෙමින් පවතින බවද සඳහන් කළ යුතු වේ.

2.2.8. යෝජනා

මහජනතාව පැමිණිල්ලකින් අපේක්ෂා කරනුයේ ක්ෂණික සහනයක් වන හෙයින් පොලිස් කොමිෂන් සභාවේ කීර්ති නාමය ඉහලට ගෙන යා හැකි සේවයක් ලෙස 1960 ක්ෂණික ඇමතුම් සේවය පත් කිරීම සඳහා නිලධාරීන් කිහිපදෙනෙකු සඳහා යොමු කිරීමට කටයුතු කිරීම.

2.2.9. සාමාන්‍ය පරිපාලන කටයුතු.

අංශයේ නිලධාරීන්ගේ නිවාඩු, වැටුප් වර්ධක නිර්දේශ, දෛනික තැපෑල ආදී සාමාන්‍ය පරිපාලන කටයුතු ඉටු කිරීම.

2.2.10.(i). එක් එක් පළාත් කාර්යාලයන්ට අදාලව 2022 වර්ෂයේ දී මහජන පැමිණිලි විමර්ශන අංශය වෙත ලද පැමිණිලි.

1960 ක්ෂණික ඇමතුම් සේවය වෙත ලද පැමිණිලි වලට අමතරව ලිඛිතව අංශය වෙත ලැබෙන පැමිණිලි පහත වගුවෙන් දැක්වෙයි. ඒ අනුව පැමිණිලි වැඩිම ප්‍රමාණයක් බස්නාහිර 1 හා 11 පළාත් කාර්යාල සහ දකුණු පළාත් කාර්යාලය වෙත ලැබී ඇත. බස්නාහිර පළාත් කාර්යාලය 1 මඟින් මුළු කොළඹ දිස්ත්‍රික්කයම ආවරණය වන පරිදිත්, බස්නාහිර පළාත් කාර්යාලය 11 මඟින් බස්නාහිර පළාතේ ගම්පහ සහ කළුතර පොලිස් බල ප්‍රදේශ ආවරණය වන පරිදිත් මහජන පැමිණිලි විමර්ශනය කරනු ලබයි.

2022 වර්ෂයේ මහජන පැමිණිලි විමර්ශන අංශයට ලැබුණු පැමිණිලි පළාත් අනුව:

2022.01.01 - 2022.12.31

වගුව 5

පළාත	2022 වර්ෂය තුලදීලැබුණු පැමිණිලි සංඛ්‍යාව
01. බස්නාහිර 1	346
02. බස්නාහිර 11	296
03. දකුණ	259
04. වයඹ	161
05. මධ්‍යම	146
06. සබරගමුව	128
07. උතුරු මැද	113
08. ඌව	89
09. නැගෙනහිර	78
10. උතුර	60
එකතුව	**1676**

***ප්‍රස්තාරය* 3**



ප්‍රස්තාරය 3 - බස්නාහිර 1, 11 හා දකුණු පළාත් කාර්යාල වල 2022 වර්ෂයේදී ලද පැමිණිලි වල ප්‍රතිශතය සමස්ථ පැමිණිලිවලින් 54% ක පමණ ප්‍රමාණයකි.

පැමිණිල්ලේ ස්වභාවය අනුව 2022 වර්ෂයේ දී මහජන පැමිණිලි විමර්ශන අංශය වෙත ලද පැමිණිලි.

වගුව 6

පැමිණිල්ලේ ස්වභාවය	2022 වර්ෂයේ දී ලද පැමිණිලි සංඛ්‍යාව	ප්‍රතිශතය %
01. පොලීසියවිසින් ක්‍රියා නොකිරීම	516	31
02. පහරදීම	403	24
03. වධහිංසාපැමිණවීම	339	20
04. බලයඅයථා ලෙස පරිහරණය	217	13
05. කාන්තාවන්ටහා ළමුන්ට හිංසා කිරීම	31	2
06. නීතිවිරෝධීලෙස රඳවා ගැනීම	20	1
07. අල්ලස්දූෂණ	64	4
08. පක්ෂග්‍රාහීවීම	5	0
09. බොරුවෝදනා කිරීම	3	0
10. පොලිස්අත්අඩංගුවේ සිටියදී මරණය සිදුවීම	27	2
11. මත්ද්‍රව්‍යවැරදි	1	0
12. වෙනත්	50	3
එකතුව	**1676**	**100**

වගුව 3 - මේ අනුව පොලීසිය විසින් ක්‍රියා නොකිරීම, පහරදීම, වධහිංසා පැමිණවීම හා බලය අයථා ලෙස පරිහරණය කිරීම යන කරුණු සම්බන්ධව වැඩි පැමිණිලි ප්‍රමාණයක් ලැබී ඇත. එය සමස්ථ පැමිණිලිවලින් 75%ක පමණ ප්‍රමාණයකි.

ප්‍රස්තාරය 4



2022 වර්ෂයේ දී ලද පැමිණිලි සම්බන්ධව **2022.12.31** දින වන විට මහජන පැමිණිලි විමර්ශන අංශයේ ප්‍රගතිය.

වගුව 7

පළාත	**2022** වර්ෂය තුලදීලද පැමිණිලි සංඛ්‍යාව	**2022.12.31** දිනවන විට පළාත් කාර්යාල මඟින් විමර්ශන අවසන් කර පළාත් සම්බන්ධීකරණ නිලධාරීන් වෙතයොමු කර ඇති සංඛ්‍යාව	**2022.12.31** දිනවන විට කොමිෂන් සභාව මඟින් විමර්ශන අවසන් කර ඇති සංඛ්‍යාව	**2022.12.31** දිනට විමර්ශන අවසන්කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුව ඇති ලිපි ගොනු සංඛ්‍යාව	විමර්ශන අවසන්කිරීම ට පළාත් කාර්යාල වල ඉතිරිව ඇති සංඛ්‍යාව
බස්නාහිර **1**	346	95	95	-	**251**
බස්නාහිර **11**	296	92	92	-	**204**
මධ්‍යම	146	32	23	9	**114**
දකුණ	259	101	76	25	**158**
උතුර	60	25	4	21	**35**
නැගෙනහිර	78	62	22	40	**16**
වයඹ	161	87	44	43	**74**
උතුරු මැද	113	90	27	63	**23**
ඌව	89	50	25	25	**39**
සබරගමුව	128	54	44	10	**74**
එකතුව	**1676**	**688**	452	236	**988**

ප්‍රස්තාරය 5



2.2.4. ජාතික පොලිස් කොමිෂන් සභාවේ පළාත් කාර්යාල

ජාතික පොලිස් කොමිෂන් සභාව ආරම්භක අවධියේ එනම් 2005-2007 වකවානුවේදීම මහජන පැමිණිලි භාරගැනීම උදෙසා පළාත් කාර්යාල පිහිටවනු ලැබීය. පළාත් කාර්යාල පිහිටුවීම නිසා ප්‍රාදේශීය වශයෙන් මෙම ක්‍රියාවලිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ද විශාල රුකුලක් වී ඇති අතර පොලිසියට එරෙහිව ඇති මහජන පැමිණිලි විමර්ශන ක්‍රියාවලිය යම් පමණක විමධ්‍යගත ක්‍රමයකට පැමිණි ඇත.

සෑම පළාතකටම එක් කාර්යාලයක් වන සේ පළාත් 09 තුළ පළාත් කාර්යාල 09 ක් පිහිටුවා ඇති අතර පළාත් අධ්‍යක්ෂවරයෙකුගේ ප්‍රධානත්වයෙන් සහ විමර්ශන නිලධාරීන්ගේ සහ සහායක කාර්ය මණ්ඩල සාමාජිකයෙකු මීට අනුයුක්ත කර ඇත. ඒ අනුව අදාල පළාත තුළ පොලිසියේ ක්‍රියා හෝ නොකර හැරීම් පිළිබඳ පැමිණිලි පළාත් කාර්යාලවලට යොමු කළ හැකිය.

විශේෂයෙන්ම පොලිසිය මඟින් සලසන මහජන සේවාවන්වලදී සහ නීතිය බලාත්මක කිරීමේදී ඇතිවන අඩුපාඩු, නීතිය හා සාමය පවත්වාගැනීමේදී සහ අපරාධ විමර්ශනයේදී, නීති විරෝධී මත්ද්‍රව්‍ය මැඩපැවැත්වීම වැනි මාතෘකා පිළිබඳව පොලිස් සේවාවේ ගුණාත්මකභාවය පිළිබඳව පළාතෙන් පළාතට ගොස් මහජන අදහස් ලබාගැනීම දිවයින පුරා පළාත් 09 යේම ක්‍රියාත්මක කිරීමට පළාත් කාර්යාල හරහා ඒවායේ සම්බන්ධීකරණය මත සිදුකෙරුනි. විශේෂයෙන්ම මහජන පැමිණිලි විශාල වශයෙන් ලැබෙන කේෂ්ත්‍ර පිළිබඳව ඉදිරි ප්‍රතිපත්ති සම්පාදනය සහ පොලිසියට එරෙහි මහජන පැමිණිලි අවම කර ගැනීමට මෙම ක්‍රියාවලිය අත්‍යවශ්‍ය වන දෙයක් බවට පත්වී තිබේ. එසේම දිගුකාලීනව මහජනයාට උසස්, ගුණාත්මක තත්ත්වයෙන් වැඩි සේවාවක් සම්පාදනය කිරීමට අවශ්‍ය කරන කටයුතු සොයාබලා ඒ සඳහා පොලිසිය මෙහෙයවීමට අවශ්‍යවන අතර පොලිසියට එරෙහිව මහජන පැමිණිලි අවම වන්නේ එවිටය.

පළාත් අධ්‍යක්ෂවරයා, ප්‍රාදේශීය ලේකම්වරයා සමඟ සම්බන්ධීකරණය වෙමින් ග්‍රාමීය මට්ටමේ ප්‍රජා සංවිධාන, ස්වෙච්ඡා සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් ප්‍රජා මූල සංවිධාන දැනුවත් කිරීමේ ප්‍රචාරන වැඩපිළිවෙලක් ද පොලිස් කොමිෂන් සභාවේ පළාත් කාර්යාල හරහා ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇත. මෙහි වගකීම පළාත් අධ්‍යක්ෂවරුන් විසින් දරනු ලැබේ. මෙමගින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ පණිවුඩය ඈත ගම් දනව්වල සිටින මහජනයා වෙත ගෙනයාමේ වගකීම පළාත් කාර්යාල හරහා සිදුවේ. එසේම කොමිෂන් සභාවේ බලතල, කාර්යභාරය සහ මහජනයා මෙන්ම පොලිස් නිලධාරින් හටද කොමිෂන් සභාවේ නව මහජන පැමිණිලි විමර්ශන ක්‍රමවේදය සහ බලතල පිළිබඳවත් මහජනයා දැනුවත් කිරීමට අත් පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරීමට සැලසුම් කර ඇති අතර මෙම කටයුතු ද සම්බන්ධීකරණය කරනු ලබන්නේ පළාත් කාර්යාල වල සිටින කොමිෂන් සභාවේ නියෝජිතයන් හරහාය.

මහජන පැමිණිලි විමර්ශන ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා පළාත් කාර්යාලවල මානව සම්පත් මෙන්ම භෞතික සම්පත් සංවර්ධනය කිරීමට කොමිෂන් සභාව පියවර ගෙන ඇත. සියලුම පලාත් කාර්යාල සඳහා පරිගනක සහ අන්තර්ජාල පහසුකම් ලබාදී ඇති අතර ප්‍රධාන කාර්යාලය සහ සියලුම පලාත් කාර්යාල සම්බන්ධීකරණය කළ හැකි වන පරිදි ජාලගත කොට මහජන පැමිණිලි විමර්ශන ක්‍රියාවලිය විද්‍යුත් ක්‍රමයක් යටතට ගැනීමේ ‘‘මහජන පැමිණිලි කළමනාකරණ පද්ධතියක්’’ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මුල්‍යාධාර යටතේ දියත් කර ඇත. ඒ අනුව දිවයිනේ ඕනෑම ප්‍රදේශයක ජීවත් වන පුරවැසියෙකුට අන්තර්ජාල පහසුකම් තිබෙනම් තම පැමිණිල්ල පිළිබඳව තත්ත්වය සොයා බැලීමටත් පැමිණිලි අන්තර්ජාලය හරහා ඉදිරිපත් කිරීමටත් හැකියාව ලැබෙන අතර ඉතා ඉක්මණින් සහ කාර්යක්ෂමව පළාත් කාර්යාල හරහා තම පැමිණිල්ලට සාධාරනය ඉටු කර ගැනීමට මහජනතාවට පහසුකම් ලැබී ඇත.

2.3 ජාතික පොලිස් කොමිෂන් සභාව 2022 වර්ෂයේ ලබා ඇති ජයග්‍රහණ, මුහුණදුන් අභියෝග සහ ඉදිරි සැලසුම්

<u>ජයග්‍රහණ</u>

1. පොලිසියට එරෙහි මහජන පැමිණිලි විමර්ශනය කිරීමේ ප්‍රමුඛ බලය සහිත මහජන ආයතනය ලෙස ජාතික පොලිස් කොමිෂන් සභාව මහජන පැමිණිල්ලක් ලද පසු, ගොනුව සකස් කිරීමේ සිට කොමිෂන් සභාව වෙත යොමු කර විමර්ශන අවසන් කිරීමෙන් පසු ගොනුව ලේඛනාගාරය වෙත භාරදීම දක්වා වූ විමර්ශන පටිපාටිය සකස් කිරීම සහ ඒ පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීම මඟින් පැමිණිලි විමර්ශන ක්‍රියාවලිය විධිමත් සහ ශක්තිමත් කිරීමට හැකි වීම.

2. 2021,2018 සහ 2019 වර්ෂවල ගොඩගැසී තිබූ විමර්ශන ගොනු 2022 වසර තුළ කඩිනමින් විමර්ශනය කර අවසන් කිරීමට හැකිවීම.

3. විමර්ශන සඳහා අදාල තොරතුරු ලබා ගැනීම සඳහා පැමිණිලිකරුට සහ පොලිසිය වෙත ප්‍රශ්නාවලි සකස් කර ක්‍රියාත්මක කිරීමට හැකිවීම.

4. විද්‍යුත් මාධ්‍ය ඔස්සේ මහජනයා දැනුවත් කිරීම මඟින් ජාතික පොලිස් කොමිෂන් සභාවේ ප්‍රතිරූපය වර්ධනය කිරීමට කටයුතු කිරීම.

5. 2022 වර්ෂයේ මහජන පැමිණිලි විමර්ශනය කඩිනම් සහ වේගවත් කිරීම හරහා මහජන ගෞරවය සහ ප්‍රසාදය ලබා ගැනිමට හැකිවීම සහ කොමිෂන් සභාව පිළිබඳ මහජන විශ්වාසය ගොඩනංවා ගැනීමට හැකිවීම.

6. 1960 දුරකතන අංකය හරහා ලැබෙන පැමිණිලිවලට ක්ෂණික සහන ලබාදීමට කටයුතු කිරීම විශාල සාර්ථකත්වයක් අත්පත්කර ගැනීමට හැකිවීම සහ මහජනයාගෙන් යහපත් ප්‍රතිචාර ලැබීම.

7. 2022 වර්ෂයට අදාලව එක්සත් මානව හිමිකම් සංවිධානය විසින් ලබාදුන් හොඳම උපකාරක සේවයට හිමි **Voice for vioveless** සම්මානය 1960 වෙනුවෙන් ලැබීම.

<u>අභියෝග</u>

1. 2022 වර්ෂයේ රටේ සිදුවූ කැලැබිලිකාරී තත්ත්වය සහ ප්‍රවාහන මාධ්‍ය ඇතුළුව සාමාන්‍ය ජන ජීවිත බිඳවැටීම නිසා කොමිෂන් සභාවේ මහජන පැමිණිලි විමර්ශන ක්‍රියාවලියට යම් ප්‍රමාණයකට බාධා පැමිණීම සහ නිලධාරීන්ට සේවයට වාර්තා කිරීමේ අපහසුතා පැන නැඟීම.

2. මුල්‍යමය සීමාකම් හේතුවෙන් ඇතැම් වැඩිදියුණු කිරීම ක්‍රියාත්මක කිරීමට බාධා පැමිණීම. නිදසුනක් ලෙස 2018 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රදානයක් ලෙස ක්‍රියාත්මක කළ මහජන පැමිණිලි කළමනාකරණ පද්ධතිය පසුගිය වසර 2-3 තුල ක්‍රියාවට නැංවීම මුල්‍ය සීමාකම් නිසා නතර වීම.
3. කොමිෂන් සභාව සඳහා පුරප්පාඩු කාර්ය මණ්ඩල බඳවා ගැනීමේදී රාජ්‍ය වියදම් සීමා කිරීම් අභියෝගාත්මක ලෙස බලපෑම.

4. 1960 දුරකතන අංකය හරහා අසත්‍ය පැමිණිලි ලැබීම සහ ඇතැම් පොලිසිවලින් නිසි සහාය නොලැබීම.

<u>2023 වසර සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ ඉදිරි සැලසුම්</u>

1. පොලිස් නිලධාරීන්ට සහ පොලිස් සේවයට එරෙහිව ලැබෙන පැමිණිලිවලට පාදකවන හේතු අධ්‍යයනය කර හඳුනාගන්නා ලද කරුණු අනුව පොලිස් නිලධාරීන් බඳවා ගැනීම, පුහුණු කිරීම, මෙහෙයවීම, පාලනය, අධීක්ෂණය, කළමනාකරණය සහ විනය කටයුතු සම්බන්ධයෙන් නිසි නව ක්‍රමවේදයක් **(System change)** වෙනුවෙන් වැඩපිළිවෙලක් නිර්මාණය කිරීම සහ ඒ පිළිබඳ පොලිස් නිලධාරීන් සමඟ සංවාදයකට එළඹීම.

2. වර්ෂය අවසන්වන විට ලැබෙන පැමිණිලිවලින් ¾ ක් විමර්ශන අවසන් කිරීම.

3. විමර්ශන අවසන් නොවූ පසුගිය වර්ෂවල සියලු පැමිණිලිවලට අදාල විමර්ශන අවසන් කිරීම.

4. විමර්ශන නිලධාරීන්ගේ දැනුම් අවබෝධය සහ කුසලතා මෙන්ම පෞරුෂ සංවර්ධන කිරීමේ සැලසුම් ක්‍රියාත්මක කිරීම.

5. පොලිස් දෙපාර්තමේන්තුව යුගයට ගැළපෙන ලෙස පරිවර්තනය කිරීමට සහ මහජන මිත්‍රශීලී පොලිස් සේවයක් නිර්මාණය කිරීමට සැලසුම් කිරීම.

6. 1960 ක්ෂණික දුරකතන අංකය මඟින් වන සේවාව දීපව්‍යාප්තව විධිමත් කිරීම සඳහා අවශ්‍ය මහජන දැනුවත් කිරීම සිදුකරමින්, අවශ්‍ය නිලධාරීන් පුහුණු කර, ඇමතුම් මධ්‍යස්ථානයක් මට්ටමට සංවර්ධනය කිරීම.

03 පරිච්ඡේදය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය



එසිජ්-එප්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තත්‍ය 2022 රු.	2021 රු.	
	ආදායම් ලැබීම්		0	0	
	ආදායම් බදු	1	0	0	
	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	0	0	එසිජ්-1
	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	0	0	
	බදු නොවන ආදායම් හා වෙනත්	4	0	0	
	මුළු ආදායම් ලැබීම් (අ)		0	0	
	ආදායම් නොවන ලැබීම්		0		
	භාණ්ඩාගාර අග්‍රිම		143,078,000	143,488,600	එසිජ්-3
	තැන්පතු		80,700	223,676	එසිජ්-4
	අත්තිකාරම් ගිණුම්		4,030,407	3,327,330	එසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		0	0	
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		147,189,107	147,039,606	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		147,189,107	147,039,606	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		4,558	9,683	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		147,184,549	147,029,923	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්		0	0	
75,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	71,319,373	68,970,974	
67,715,611	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	65,964,702	68,929,571	එසිජ්-2(ii)
650,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	439,706	545,059	
600,000	පොළී ගෙවීම්	8	579,297	839,747	
3,373,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	2,880,321	0	
147,838,611	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		141,183,398	139,285,351	
	මූලධන වියදම්				
1,361,389	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	961,389	746,050	
3,510,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	3,204,279	4,707,290	
0	ප්‍රාග්ධන මාරුකිරීම්	12	0	0	එසිජ්-2(ii)
0	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	0	0	
300,000	හැකියා වර්ධනය	14	212,500	480,000	
0	වෙනත් මූලධන වියදම්	15	0	0	
5,171,389	මුළු මූලධන වියදම් (උ)		4,378,168	5,933,340	
	තැන්පතු ගෙවීම්		156,121	141,705	එසිජ්-4
3,000,000	අත්තිකාරම් ගෙවීම්		3,427,848	3,978,102	එසිජ්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		0	0	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		3,583,969	4,119,807	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		149,145,535	149,338,498	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		-1,960,986	-2,308,575	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		-1,960,986	-2,308,575	එසිජ්-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		0	0	එසිජ්-3

01

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය



ඒසිඒ-8

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	කළඹ 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	62,847,244.53	63,785,123.13
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	8,808,658.79	9,411,217.79
මුදල් හා මුදල් සමාන ද	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**71,655,903.32**	**73,196,340.92**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		8,802,108.79	9,329,246.79
දේපළ පිරියත හා උපකරණ සංචිතය		62,847,244.53	63,785,123.13
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
බැඳුම් වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	6,550.00	81,971.00
අදාළ ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**71,655,903.32**	**73,196,340.92**

පිටු අංක..01..සිට ..30..දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සැලසුම් පිටු අංක ..31.. සිට ..40.. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයෙන්හි සටහන් මඟින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2023.02.23
සමරා ඩී. පෙරේරා.
ලේකම්
ජාතික පොලිස් කොමිෂන් සභාව

.....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2023.02.23
ඩී. එල්. ඩී. ප්‍රමිති
ප්‍රධාන ගණකාධිකාරි
ජාතික පොලිස් කොමිෂන් සභාව

02

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය



ඒසිඒ-සි

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	කණ්ඩායම	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුල් බදු ලැබීම්	0	0
පාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	0	0
ලාභ	0	0
ආදායම් නොවන ලැබීම්	2,535,190	2,333,993
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	0	0
අග්‍රිම ලැබීම්	143,078,000	143,488,600
අත්තිකාරම් අයකර ගැනීම්	3,576,124	3,162,990
තැන්පතු ලැබීම්	80,700	223,676
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	149,270,014	149,209,259
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	140,677,193	138,598,508
භාණ්ඩාගාර සහ මාරුකිරීම්	439,706	545,059
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	186,420	0
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	4,558	9,683
අත්තිකාරම් ගෙවීම්	3,427,849	3,980,964
තැන්පතු ගෙවීම්	156,121	141,705
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	144,891,847	143,275,919
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	4,378,168	5,933,340
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	0	0
ලාභාංශ	0	0
භෞතික වත්කම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	0	0
උපාය අයකර ගැනීම්	0	0
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	0	0
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	4,378,168	5,933,340
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	4,378,168	5,933,340
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	-4,378,168	-5,933,340
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	0	0
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ලැබීම්	0	0
විදේශීය ණය ලැබීම්	0	0
ප්‍රදාන ලැබීම්	0	0
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	0	0
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	0	0
විදේශීය ණය ආපසු ගෙවීම්	0	0
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	0	0
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	0	0
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ) (* සටහන)	0	0
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	0	0
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	0	0

03

3.4 මුල්‍ය ප්‍රකාශ සටහන්

මුල්‍ය ප්‍රකාශනවල ඇති ඉහත සියලු අගයන් භාණ්ඩාගාර ප්‍රකාශන සමඟ සැසඳේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදය මිකේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ල දඅාදායම්	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.02.02.99 (12202099)	පොළිය- අනෙකුත්			348	
20.03.99.00 (12399000)	අනිකුත් ලැබීම්			141	
20.04.01.00 (12401000)	වැ.අ.වි.වැටුප් දායක මුදල්			2002	
2020.06.02 (12602002)	වෙනත්			44	
එකතුව				2535	

3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදනවර්ගය	වෙන්කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	148,600	147,839	141,183	95%
ප්‍රාග්ධන	4,410	5,171	4,378	85%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තුමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තුමේන්තුව	ප්‍රතිපාදනයේඅරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගන්නාලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල්ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
	නැත.					

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000					
වත්කම්කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණය නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	නැත.	62,847		
9152	යන්ත්‍රෝපකරණ	-			
9153	ඉඩම්	නැත.			
9154	අස්පෘශ්‍යවත්කම්	නැත.			
9155	ජීව විද්‍යාත්මක වත්කම්	නැත.			
9160	ක්‍රියාත්මක වන වැඩ	නැත.			
9180	බදුදෙනලදවත්කම්	නැත.			

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. JLO/D/NPC/SR/2022

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 මැයි 23 දින

ලේකම්,
ජාතික පොලිස් කොමිෂන් සභාව

ශීර්ෂය 08 - ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

ශීර්ෂය 08 - ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජාතික පොලිස් කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 බැඳීම් හා බැරකම්වලට එළඹීම

මූල්‍ය ප්‍රකාශනයේ 2022 දෙසැම්බර් 31 දිනට රු.20,916 ක් වූ බැඳීම් හා බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

3.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

විගණනයට ලබා දී තිබූ තොරතුරු අනුව මහජන පැමිණිලි විමර්ශනයේ ප්‍රගතිය පහත පරිදි වේ.

(අ) 2020 හා ඊට පෙර වර්ෂ වලදී සියයට 70 ඉක්මවූ පැමිණිලි විභාග කිරීමේ, ප්‍රගතියක් පැවතියද, 2022 දෙසැම්බර් 31 දිනට ලද පැමිණිලි විමර්ශන අවසන් කිරීමේ ප්‍රගතිය සියයට 27 ක් විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විමර්ශන අවසන් කිරීමේ අඩුම ප්‍රගතිය සියයට 7 ක් උතුරු පළාතේ ද සියයට 16 ක් මධ්‍යම පළාතේද විය.

(ආ) බස්නාහිර I, II, දකුණ හා වයඹ යන පළාත් සඳහා වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් වන මුළු පැමිණිලිවලින් සියයට 21 ක් 18 ක් 15 ක් හා 10 ක් ලෙස ලැබී තිබුණු අතර විමර්ශනය අවසන් කළ ප්‍රගතිය සියයට 27 ක් 31 ක් 29 ක් හා 27 ක තරම් අඩු මට්ටමක පැවතුණි.

(ඇ) පැමිණිලි ස්වභාවය අනුව පොලිසිය විසින් ක්‍රියා නොකිරීම, බලය අයථා පරිහරණය හා පක්ෂග්‍රාහී වීම යන පැමිණිලි වැඩි ප්‍රමාණයක් ලැබී තිබුණු අතර එය ලද මුළු පැමිණිලිවලින් සියයට 31 ක් 24 ක් හා 20 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයේදී එම පැමිණිලි විසඳූ ප්‍රගතිය සියයට 24 ක් 23 ක් හා 22 ක් තරම් අඩු මට්ටමක විය.

3.1.2 **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශ සමග ඉදිරිපත් කලයුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි.

3.2 **පාඩු හා හානි**

රාජකාරී ජංගම දුරකථනයක් 2022 අප්‍රේල් 12 වන දින අස්ථානගත වී තිබුණි. 2022 නොවැම්බර් 18 දින මූලික විමර්ශනයේ මු.රෙ. 105 ප්‍රකාරව නැති වූ ජංගම දුරකථනයේ වර්ථමාන වටිනාකම රු.71,249 ක් ලෙස හඳුනාගෙන තිබුණ ද 2022 දෙසැම්බර් 31 දිනට එම අලාභය වාර්තා කර නොතිබුණි.

4. **යහ පාලනය**

4.1 **අභ්‍යන්තර විගණනය**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කොමිෂම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. **මානව සම්පත් කළමනාකරණය**

කොමිෂන් සභාවේ කාර්ය භාරය ඉටු කිරීම සඳහා 2022 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳව විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත ප්‍රමාණය	තථ්‍ය සේවක සංඛ්‍යාව		පුරප්පාඩු
		ස්ථීර	කොන්ත්‍රාත්	සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	30	5	10	15
තෘතියික මට්ටම	04	3	-	1
ද්විතික මට්ටම	74	47	02	25
ප්‍රාථමික මට්ටම	19	15	-	4
එකතුව	127	70	12	45

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ප්‍රධාන කාර්යාලයේ නීති නිලධාරී තනතුර හා නියෝජ්‍ය ප්‍රධාන විමර්ශන නිලධාරී තනතුරු පුරප්පාඩුව පැවතීම හා ප්‍රාදේශීය කාර්යාල 03 ක විමර්ශන නිලධාරී පත්කර නොතිබීම පැමිණිලි හා විමර්ශන ප්‍රමාදයට ද හේතු විය හැකි බව නිරීක්ෂණය විය.

(ආ) කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 30 න් 15 ක් හෙවත් සියයට 50 ක් පුරප්පාඩුව පැවතුණු අතර ඉන් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, නියෝජ්‍ය අධ්‍යක්ෂ, ප්‍රධාන විමර්ශක, නීති නිලධාරී, අභ්‍යන්තර විගණක යන තනතුරු පුරප්පාඩුව පැවතුණි.

(ඇ) ද්විතීක මට්ටමේ තනතුරු සියයට 34 ක් පුරප්පාඩුව පැවති අතර සංවර්ධන නිලධාරී, කළමනාකරණ සේවා නිලධාරී හා තොරතුරු තාක්ෂණ සහකාර තනතුරු පුරප්පාඩුව පැවතීම කාර්ය සාධනයට බාධාවක් බව නිරීක්ෂණය විය.

(ඈ) විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම සඳහා වූ 2018 පෙබරවාරි 20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2018 හි 02 (iv) ඡේදය ප්‍රකාරව මොනම හේතුවක් නිසා හෝ වයස අවුරුදු 67 සම්පූර්ණ කළ කිසිවෙකු රාජ්‍ය සේවයේ තනතුරකට පත් නොකළ යුතු වුවද ජාතික පොලිස් කොමිෂන් සභාවේ බස්නාහිර පලාත් අධ්‍යක්ෂ තනතුරට 2022 මාර්තු 02 දින සිට 2023 මාර්තු 01 දින දක්වා කොන්ත්‍රාත් පදමට අවු. 67 සම්පූර්ණ වූ විශ්‍රාමික නිලධාරියෙකු පත්කර තිබූ අතර මසකට රු.60,000 බැගින් අදාල වර්ෂය සඳහා රු.720,000 ක් චක්‍රලේඛයට පටහැනිව ගෙවා තිබුණි.

ආර්.එස්. කටුගම්පල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය
කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරකම් සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ය නිමැවුම		
	100%- 90%	75%-89%	50%- 74%
පොලිසියට එරෙහිව පොලිස් නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි හා අපරාධ ස්වභාවයක්ගන්නා පැමිණිලි විමර්ශනය කිරීම සඳහා විශේෂ විමර්ශන ඒකකයක් ස්ථාපනය කිරීම සහ සියලු පැමිණිලි සඳහා විසඳුම් ලබාදීම.		✓	
ජාතික පොලිස් කොමිෂන් සභාවට ලැබෙන සියලු මහජන පැමිණිලිවිමර්ශනය කිරීම සහ සහන සැලසීම.		✓	
කාර්ය මණ්ඩලය දැනුමින්, කුසලතාවලින් සහ ආකල්පවලින් සන්නද්ධ කරනු වස් ඔවුන් සඳහා පුහුණු සැලැස්මක් පිළියෙල කිරීම.	✓		
කොමිෂන් සභාවේ තාක්ෂණික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, සංක්‍රමණිකයින් සඳහා වන ජාත්‍යන්තර සංවිධානය සහ සංවර්ධනය සඳහා වන ඇමරිකානු ආධාර ආයතනය මගින් යෝජනාකර ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.			✓
මහජනයාට හා පොලිස් නිලධාරීන්ට පහසුවෙන් ප්‍රවේශවීමට හැකි වන පරිදි ජාතික පොලිස් කොමිෂන් සභාවේ වෙබ් අඩවිය වැඩි දියුණුකිරීම සහ යාවත්කාලීන කිරීම.		✓	
තොරතුරු දැන ගැනීමේ පනත යටතේ මහජනයා හා පොලිස්නිලධාරීන් විසින් කර ඇති සියලු තොරතුරු ඉල්ලීම සඳහා අවසන් ප්‍රතිචාර දැක්වීම.		✓	
පාර්ලිමේන්තුවට, ජනාධිපති කාර්යාලයට සහ ව්‍යවස්ථා දායක සභාව වෙත යොමු කළයුතු පරිපාලන වාර්තා කලට වේලාවට යැවීම.	✓		
ජාතික පුවත්පත් වෙත ප්‍රවෘත්තිනිවේදනයක් නිකුත් කිරීම.		✓	

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	යම්දක්වා ජයග්‍රහණලබාගැනීමේප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
SDG ඉලක්ක 16 ජාතික ව්‍යවස්ථාපිත නීතිවලටඅනුකූලව (තොරතුරු දැනගැනීමේ පනත) තොරතුරු දැන ගැනී මෙහැකියාව ශක්තිමත් කිරීම.	මහජනයා හා පොලිස් නිලධාරින් විසින් ඉල්ලා සිටින තොරතුරු ඉල්ලීම් සියල්ලටම ප්‍රතිචාර දැක්වීම.	2022 වර්ෂය තුළ ඉදිරිපත්වූ තොරතුරු ඉල්ලීම් 34කින් ඉල්ලීම් 26 කට අදාලව තොරතුරු ලබාදී ඇති අතර ඉල්ලීම් 06 ක් ප්‍රතික්ෂේප කර ඇත.			✓
සෑමමට්ටමකදීම වගකීමට බැඳී සිටින සහ විනිවිදභාවයකින්යුත් ඵලදායී ආයතන සංවර්ධනය කිරීම.	ජාතික පොලිස් කොමිෂන් සභාව සඳහා මහජන උපායමාර්ග සංවර්ධනයකිරීම.				✓
සියලු මට්ටමකට ධාරිතා සංවර්ධනය සඳහා අන්තර්ජාතික සහයෝගීතාවය තුළින් ජාතිකපොලිස් කොමිෂන් සභාවේ සමස්ත ධාරිතාව සංවර්ධනය කිරීම.	දේශීය හා විදේශීය කාර්යවල පුහුණුව හරහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ දැනුම කුසලතා හා ආකල්ප ඉහළ නැංවීම.	වේගවත් සේවාසම්පාදනයට මහජන අභියාචනාවන්ට ක්ෂණික ප්‍රතිචාරය වේගවත් සහනය ලබා දීම.		✓	

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීී මේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

ජාතික පොලිස් කොමිෂන් සභාවට අදාල තිරසර සංවර්ධන ඉලක්ක වන්නේ SDG ඉලක්ක 16 වේ. මෙම ඉලක්ක සපුරා ගැනීමේදී ජාතික පොලිස් කොමිෂන් සභාවට අභියෝග ගණනාවකට මුහුණපෑමට සිදුවිය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරනු ලැබූ 20 වන සංශෝධනයත් සමඟ ජාතික පොලිස් කොමිෂන් සභාවේ බල වපසරිය වෙනස්වීමත් පොලිසියට එරෙහිව මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි බාරගෙන විමර්ශනය කිරීම සහ සහන සැලැස්වීමේ බලතලවලට සීමාවූ අතර ඒ සඳහා නව ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට වත්මන් කොමිෂන් සභාව පියවර ගනු ලැබීය.

මෙම නව ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා නව පළාත් අධ්‍යක්ෂවරුන් බඳවා ගත් අතර ඔවුන් මෙම ක්‍රමවේදය පිළිබඳව පුහුණු කිරීමත්, විමර්ශන නිලධාරීන් එකී ක්‍රමවේදය සඳහා හුරුපුරුදු කිරීමත් අභියෝගාත්මක වූ අතර ආයතනික ධාරිතා සංවර්ධනය කිරීමත් කාර්ය මණ්ඩල පුහුණු කිරීමත් අඛණ්ඩව සිදුකරන්නේ පවතී.

2022 වර්ෂයේ අගභාගයේදී 21 වන සංශෝධනය අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවට පූර්ණ බලතල ලැබී ඇති අතර ඒ අනුව ඉදිරියේදී වඩාත් ශක්තිමත් ලෙස තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට සැලසුම් සකස් කරමින් ඇත.

06 පරිච්ඡේදය
මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	30	15	15
තෘතීයික	04	03	01
ද්විතීයික	74	49	25
ප්‍රාථමික	19	15	04

6.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

අනුමත කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සඳහා අදාල පත්වීම් බලධාරින් විසින් නිලධාරින් ලබා නොදීම නිසා දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරනලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ත ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
පශ්චාත්උපාධි පාඨමාලා	03		රු. 212,500.00	-	දේශීය	කුසලතාව/ආකල්ප වැඩිදියුණු කර ගැනීම.

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

ඇතැම් ක්ෂේත්‍ර සඳහා විශේෂයෙන්ම නව තාක්ෂණික දැනුම පිළිබඳ පුහුණුව කාර්ය මණ්ඩලය වෙත ලබාදීමට නිරන්තරව කටයුතු කර ඇත. එමගින් කොමිෂන් සභාවේ කටයුතුවල කාර්යසාධනය ඵලදායී මෙන්ම පෙරට වඩා වේගවත් වී ඇත.

07 පරිච්ඡේදය
අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දින ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂිකමූල්‍ය ප්‍රකාශ	අනුකූලවේ		
1.2	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූලවේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	මෙම ගිණුම් ආයතනය තුළ පවත්වා නොගනී	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		
1.6	වෙනත්	අනුකූල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.4	අභ්‍යන්තර විගණන ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නැත.	අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III /II ශ්‍රේණියේ තනතුරකට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන ඇති අතර නිලධාරියෙකු අනුයුක්ත කරන ලෙස

				පත්වීම්බලධාරියාගෙන් අවස්ථා ගණනාවකදී ඉල්ලුම් කළත් මෙතෙක් නිලධාරියෙකු ලබා නොදීම හේතුවෙන් අභ්‍යන්තර විගණක අංශය ස්ථාපිත කිරීමට නොහැකි වී ඇත.
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහාභාණ්ඩාගාරට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූලවේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.11	උප පත්‍රිකා ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූලවේ		
3	**මුල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මුල්‍ය බලතල ආයතනය තුළ පවරාදී තිබීම	අනුකූලවේ		
3.2	මුල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූලවේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූලවේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූලවේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			

4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර නැත.	යොමුව 2.4
4.4	වාර්ෂික ඇස්තමේන්තු සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.	අනුකූලවේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියමකොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූලවේ		
6	**අභ්‍යන්තරවිගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දීවිගණකාධිපතිවරයා සමඟ සාකච්ඡාකිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කිරීම	අනුකූලනොවේ	අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර නැත.	යොමුව 2.4.
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූලනොවේ	,,	යොමුව 2.4.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම	අනුකූලනොවේ	,,	යොමුව 2.4.
6.4	මුදල්රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුමඅභ්‍යන්තරවිගණනප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූලනොවේ	,,	යොමුව 2.4.
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන කළමනාකරණ කමිටු 04ක්වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 01 ක් පවත්වා ඇත.	
8	**වත්කම් කළමනාකරණ**			

8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳතොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
8.2 8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත්කර එමනිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූලවේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛඅංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණයවූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූලවේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩුකාලයක දී අපහරණය කර තිබීම	අදාළ නොවේ.	ගර්හිත වාහන නොමැත.	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙනයාම	අනුකූලවේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූලවේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය නැවත පරීක්ෂා කිරීම	අනුකූලවේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදුවාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූලවේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			

10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූලවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කරතිබීම	අනුකූලවේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූලවේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසනලද ප්‍රතිපාදනයන් උපයෝජනය කළපසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලැඹීම.	අනුකූලවේ		
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූලවීම	අනුකූලවේ		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූලවේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූලවේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූලවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව පර්යේෂණය කර තිබීම	අනුකූලවේ		
14.2	මු.රෙ. 37 ප්‍රකාරව නිකුත් කළ තත් කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන්වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලවේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූලවේ		

14.4	අග්‍රීම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූලවේ		
15	**ආදායම් ගිණුම**			
15.1	ආදායම් මුදල් රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූලවේ		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම	අනුකූලවේ		
15.3	මු.රෙ. 176 අනුව ඕහ ආදයම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූලවේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූලවේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූලවේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම.**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූලවේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පලකිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූලවේ		
17.3	තොරතුරු දැනගැනී මේපනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූලනොවේ		
18	**පුරවැසි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම**			

18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූලනොවේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥාප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මකකිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූලනොවේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම්කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූලවේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූලවේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම්කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූලනොවේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙලකිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනයකිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව ගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූලවේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූලවේ		

අවසානය